කොවිඩ්-19 වසංගතය මර්දනය සඳහා අප සටන් කරමින් සිටින මේ මොහොතේදී, මාධ්‍ය මඟින් කොවිඩ්-19 ආසාදිතයින් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් සහ ගර්හාවක් නිර්මාණය වන ආකාරයෙන් පුවත් ඉදිරිපත් කිරීම ආචාරධාර්මික උල්ලංඝනයක් පමණක් නොවේ. එය මේ මොහොතේ මාධ්‍ය අත රැඳි සමාජ වගකීම ඉෂ්ට නොකිරීමක්ද වේ.
[කොවිඩ්-19] වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන පුද්ගලයින්" ලෙස හැඳින්වීමෙන් වළකින්න" යනුවෙන් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණය සඳහා ඉදිරිපත් කොට ඇති නිර්දේශයන් තුල දැක්වෙන බව ද බවද මෙහිදී අවධාරණය කළ යුතුය.

එසේ ගත් විට, දිවයින පුවත්පතේ පළවී ඇති (12/07) මෙවැනි ආකාරයේ සිරස්තල ඔස්සේ, කොවිඩ්-19 රෝගීන් රෝගය පැතිරවීමට වගකිවයුතු යැයි ගම්‍ය නොවේද? කොවිඩ්-19 වැළදීම කිසිසේත්ම පුද්ගලයකුගේ වරදක් නොවේ. එසේ නම්, ආසාදිතයින් කොන් කිරීමකට ලක් කෙරෙනා ආකාරයේ මෙවැනි සිරස්තල, මතු සඳහන් කළ නිර්දේශයන් උල්ලංඝනය කරන්නේ නොවේද?